දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT - UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2012 පෙබරවාරි
First Examination in Arts (External) - February 2012

# භූවිප්‍ර 1.1 - මානව භූගෝල විද්‍යාව
# GY 1.1 – Human Geography

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

---

(01) 'මානව භූගෝල විද්‍යාවේ මූලික හරය, මිනිසා සහ පරිසරයයි.' ඉහත තේමා යටතේ ගොඩනැගුණු මත හා සංකල්ප කවරේදැයි ප්‍රමාණවත් උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

(02) <u>එක්කෝ</u>
'මානව සංස්කෘතික පරිණාමය යනු ස්වාභාවික පරිසරය ක්‍රමික ව භාවිතයට ගැන්ම සඳහා කළ සටනක ප්‍රතිඵලයකි.' මෙම ප්‍රකාශය විමර්ශනය කරන්න.

(ලකුණු 20 යි)

<u>නැතහොත්</u>
මානව වර්ග (Human Races) හඳුනාගැනීම සඳහා බාහිර ලක්ෂණ මත පදනම් වූ නිර්ණායක කොතෙක්දුරට යෝග්‍ය වන්නේ දැයි, විසමන්න.

(ලකුණු 20 යි)

(03) 2011 ඔක්තෝබර් 31 වැනි දින ලෝක ජනගහනය බිලියන 7 ලෙස වාර්තා කෙරුණි. අභියෝගාත්මක සංඛ්‍යාවක් ලෙස මෙම ජන සංඛ්‍යාව හා සම්පත් අතර තුලනයක් පවත්වාගෙන යා හැකි ද? සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

(04) I) ලෝකයේ දක්නට ලැබෙන ප්‍රධාන කෘෂිකාර්මික පද්ධති සහ ඒවා පවතින ප්‍රධාන ප්‍රදේශ 2 බැගින් දක්වන්න.

(ලකුණු 08 යි)

II) සලගොවිතැනෙහි දක්නට ලැබෙන වත්මන් ප්‍රධාන ලක්ෂණ හා ප්‍රවනතා පෙන්වා දෙන්න.

(ලකුණු 12 යි)

(05) I) නැගී එන කාර්මික රටවල්හි දක්නට ලැබෙන නූතන ප්‍රවනතා පෙන්වා දෙන්න.

(ලකුණු 10 යි)

II) කාර්මික වූ රටවල මෑතකාලීන පසුබෑම සඳහා කිනම් සාධක හේතු වී ඇත්දැයි පරීක්ෂා කරන්න.

(ලකුණු 10 යි)

(06) I) 'තිරසර සංවර්ධනය' (Sustainable Development) යනුවෙන් අර්ථවත් වන්නේ කුමක්දැයි සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

II) වර්තමානයේ සංවර්ධනය වන රටවල තිරසර සංවර්ධනයක අවශ්‍යතාව වඩාත් ඉස්මතු වන්නේ කවර හේතු මතදැයි විමර්ශණය කරන්න.

(ලකුණු 12 යි)

(07) ඉතා සීමිත සම්පත් වන 'භූමි සම්පත්' හායනය කෙරෙහි මිනිස් ක්‍රියාකාරකම් හේතු වී ඇති අයුරු නිදර්ශනාත්මක ව විමසන්න.

(ලකුණු 20 යි)

(08) මතු සඳහන් කරුණු අතරින් <u>දෙකක්</u> පිළිබඳ ව සටහන් ලියන්න.

i. ජන විද්‍යාත්මක සංක්‍රාන්ති ආදර්ශකය හා සංවර්ධනය වන රටවල්
ii. සංවර්ධනය පිළිබඳ නූතන දර්ශක
iii. සංවර්ධනය වන රටවල දැවැන්ත නගර (Mega Cities)
iv. ගෝලීයකරණය හා දියුණුවන රටවල්

(ලකුණු 10 x 2 = 20 යි)